අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

31 වැනි කාණ්ඩය | 59 වැනි පත්‍රය | පිටු 20 යි කොටස් 2 යි | විජය ප්‍රකාශනයක් | 2021 නොවැම්බර් මස 17 වැනිදා බදාදා | අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk | මිල රුපියල් 30.00 යි

## කළුකඩකාරයෝ ගෑස් සිලින්ඩරය පහළොස්දහකට-විසිදහට නගගලා



10 පිටුව බලන්න

## සම්ප්‍රදායෙන් පිටපැන මරණ දඬුවමක් නියම කරයි

## පාස්කුදා ප්‍රහාර අයිතිවාසිකම් නඩුව:

# විනිසුරුවෝ දෙදෙනෙක් අයින්වෙති

(තිළිණි ද සිල්වා සහ රංජන් කටුගම්පොළ)

බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය මැඬ පැවැත්වීමට කටයුතු නොකිරීමෙන් සිය මූලික අයිතිවාසිකම් කඩ කළැයි චෝදනා මත හිටපු ආරක්ෂක ලේකම් හා හිටපු පොලිස්පතිවරයා ඇතුළු පිරිසකට එරෙහිව ගොනුකර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම් 12 විභාග කළ සත්පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලේ සාමාජික විනිසුරුවරුන් දෙදෙනෙක් පෞද්ගලික හේතූන් මත ඊයේ (16) එම පෙත්සම් විභාගයෙන් ඉවත් වූහ.


6 වැනි පිටුවට

## තෙල් ගහගන්න දිගු පෝලිම්: සමහර ඉන්ධනහල් වහලා

(යොහාන් භාසුර)

ඉන්ධන ලබාගැනීම සඳහා කොළඹ ඇතුළු ප්‍රදේශ ගණනාවක ඉන්ධන පිරවුම්හල්වල ඊයේ ද (16) දිගු පෝලිම් දක්නට ලැබුණු අතර, ඇතැම් පිරවුම්හල්වල ඉන්ධන අවසන් වී, ඒවා වසා දමා තිබෙනු දක්නට ලැබිණි.

6 වැනි පිටුවට



කොළඹ නගරයේ ඉන්ධන පිරවුම්හලක ඉන්ධන අවසන් වීම නිසා වසා තිබූ ආකාරය. (ඡායාරූපය: ශාන්ත රත්නායක)

## විනිමය අවුල විසඳෙනතුරු අකැමැත්තෙන් වුණත් බඩු හිඟයකට මුහුණ දෙන්න වේවි



(ඩයනා උදයංගනී)

විදේශ විනිමය අර්බුදය විසඳෙන තුරු අකැමැත්තෙන් වුවත් භාණ්ඩ හිඟයකට මුහුණ දීමට සිදුවන බව සම කැබිනට් ප්‍රකාශක, බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මහතා ඊයේ (16) පැවසීය.

6 වැනි පිටුවට

## පාසල්වල 6-7-8-9 පන්ති සඳුදා ඇරඹේ

## සා.පෙළ - උසස් පෙළ ටියුෂන් පන්තිවලට අවසර

## හල්දුම්මුල්ල පාසල් 4 ක ගුරු-සිසු පිරිසකට කොරෝනා: විදුහලක් වසයි

## හැටට වැඩි අයට තෙවැනි මාත්‍රාව දීම අද සිට

10 පිටුව බලන්න

## සමගි ජන බලවේග විරෝධතා පා ගමනට මහ පිරිසක් එති

(නිමල කොඩිතුවක්කු)

වැඩිවන ජීවන වියදම, රටේ පවතින පොහොර හිඟය ඇතුළු ජනතාව මුහුණ දෙන ගැටලු මුල් කරගනිමින් "සාපලත් ආණ්ඩුවට එරෙහි ජනතා බලය" මැයෙන් සමගි ජනබලවේගය සංවිධානය කළ උද්ඝෝෂණ සහ විරෝධතා පා ගමන විශාල ජනතා සහභාගිත්වයක් ඇතිව කොළඹ - ගාලුමුවදොර වටරවුමේ දී ඊයේ (16) පස්වරුවේ පැවැත්විණි.

6 වැනි පිටුවට



ජනතාව මුහුණ දෙන වැඩිවන ජීවන වියදම, රටේ පවතින පොහොර හිඟය ඇතුළු ගැටලුවලට විසඳුම් දෙන්නැයි ඉල්ලා සමගි ජන බලවේගය සංවිධානය කළ "සාපලත් ආණ්ඩුවට එරෙහි ජනතා බලය" විරෝධතා රැලිය විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් කොළඹ ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට ගාලුමුවදොර පිටියේ දී ඊයේ (16) පස්වරුවේ පැවැත්විණි. එහිදී සමගි ජන බලවේගයේ නායක, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා විරෝධතා රැලිය ඇමතූ අයුරු ඡායාරූපයේ දැක්වේ.

## රටපුරා හදිසි මාර්ග බාධක දැම්මැයි විපක්ෂ චෝදනා මැතිසබය රත්කරයි

(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)

රට පුරා හදිසියේම මාර්ග බාධක යොදා පරීක්ෂා කිරීම වැඩි කිරීම සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් ආණ්ඩුවට දිගින් දිගටම චෝදනා කිරීම නිසා පාර්ලිමේන්තුවේ උණුසුම් තත්ත්වයක් ඊයේ (16) පෙරවරුවේ ඇති විය.

6 වැනි පිටුවට

## විපක්ෂය කොවිඩ් එක්ක එකතුවී ආණ්ඩුව පෙරළන්න හදනවා



10 පිටුව බලන්න

## සෞඛ්‍ය නීති කඩා පෙළපාළි උද්ඝෝෂණ කළ නායකයන්ට එරෙහිව නීතිමය පියවර

පොලිස් මාධ්‍ය ප්‍රකාශක

10 පිටුව බලන්න


EPF ණය
තොරතුරු සහ සේවාවන් දැන් SMS එකෙන්
EPF ශේෂයෙන් 75% ක ණයක්
ඔබ කළ යුත්තේ,
EPF <හිස්තැනක්>
නම සහ ප්‍රදේශය සඳහන් කර
0706 004 448 ට
SMS කිරීම පමණයි.
HDFC බැංකුව
hdfc@hdfc.lk www.hdfc.lk Fitch Rating : BB+ (lka)

අලියා මැස්කනයිට්
65 වසරක නොවෙනස් වූ ප්‍රමිතිය, ශක්තිය හා විශ්වාසය
MASCONS
0766 733 744



සිහිනවලට හඹායන්න ඉහළ පොලියක්

DFCC ස්ථාවර තැන්පතු
6.5% වා.පො.
වසරක ස්ථාවර තැන්පතු සඳහා කල්පිරීමේදී ගෙවන පොලී අනුපාතය
ස්ථාවර තැන්පතු සඳහා ආකර්ෂණීය පොලී අනුපාතයක් මෙන්ම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා 0.5% ක අමතර පොලියක් ලබාගන්න.
දැන්ම 0112 350000 අමතන්න හෝ ළඟම පිහිටි DFCC බැංකු ශාඛාව වෙත පැමිණෙන්න.
0112 350000 www.dfcc.lk
DFCC බැංකුව ඔබේ වර්ධනයට

| ශනිදා වාසනාව | අද කෝටිපති | ලග්න වාසනාව | ජාතික සම්පත | මහජන සම්පත | සුපර් බෝල් | ජයෝදා |
|---|---|---|---|---|---|---|
| 3726 වැනි වාරය | 1391 වැනි වාරය | 3277 වැනි වාරය | 1165 වැනි වාරය | 4587 වැනි වාරය | 1565 වැනි වාරය | 1785 වැනි වාරය |
| නොවැ:16 වැනිදා | නොවැ: 16 වැනිදා | නොවැ:16 වැනිදා | නොවැ: 15 වැනිදා | නොවැ: 15 වැනිදා | නොවැ: 16 වැනිදා | නොවැ: 15 වැනිදා |
| ඉංග්‍රීසි අකුර - M | ඉංග්‍රීසි අකුර - X | ලග්නය: ධනු | ජයග්‍රාහී ලග්නය - කටක | ඉංග්‍රීසි අකුර - K | ඉංග්‍රීසි අකුර - P | ඉංග්‍රීසි අකුර - V |
| 26-45-54-71 | 04-06-43-71 | 27-44-50-59 | 2-0-8-0-3-8 | 0-4-4-1-2-2 | 14-23-27-67 | 03-18-37-56 |

| සංවර්ධන වාසනාව | කෝටිපති කප්රුක | ධන නිධානය | ගොවිසෙත | සම්පත ලග්න වරම | සසිරි | මෙගා පවර් | සුපිරි වාසනා |
|---|---|---|---|---|---|---|---|
| 459 වැනි වාරය | 766 වැනි වාරය | 617 වැනි වාරය | 2882 වැනි වාරය | 04 වැනි වාරය ජූලි: 30 | 101 වැනි වාරය | 935 වැනි වාරය | 1632 වැනි වාරය |
| නොවැ: 13 වැනිදා | නොවැ: 16 වැනිදා | නොවැ: 15 වැනිදා | නොවැ: 15 වැනිදා | සම්පත: M-2-0-4-5-1-5 | නොවැ: 13 වැනිදා | නොවැ: 15 වැනිදා | නොවැ: 13 වැනිදා |
| දෛව අංකය - 05 | ඉංග්‍රීසි අකුර - E | ජයග්‍රාහී අක්ෂරය-U | ඉංග්‍රීසි අකුර-W | ලග්න වරම: මේෂ | | සුපිරි අංකය:15 | සුපිරි අංකය: 13 |
| ඉංග්‍රීසි අකුර - N | | | | | | ඉංග්‍රීසි අකුර - Y | |
| 38-60-65 | 14-18-34-43 | 08-41-46-74 | 37-42-52-67 | 17-37-84 | 16-27-49 | 08-17-38-45 | 01-37-42-49 |

# තේ පැන්හලේ ගෑස් සිලින්ඩරය පිපිරී කතක් රෝහලේ


**(රත්නපුර අධිකරණ ඒ.ජී. වික්‍රමසිංහ සහ රත්නපුර විශේෂ අප්සරා යෝෂිත් විජේසූරිය)**

රත්නපුර බස් නැවැතුම්පොළ ආසන්නයේ ඊයේ (16 වැනිදා) තේ පැන් ශාලාවක ගෑස් සිලින්ඩරයක් පිපිරී කාන්තාවක බරපතළ තුවාල ලබා රෝහල්ගත කර ඇතැයි රත්නපුර පොලිසිය පවසයි.

මෙම පිපිරීමෙන් තේ පැන් ශාලාවේ ගෑස් සිලින්ඩරය අසල සිටි 45 හැවිරිදි සේවිකාවක පිළිස්සුම් තුවාල ලබා ඇතැයි පොලිසිය පවසයි.

මෙම ගෑස් සිලින්ඩරය පිපිරීම නිසා තේ පැන් ශාලාවේ ඉහළ සිවිලිම සහ වීදුරු ආවරණය කැඩී බිඳී විශාල හානියක් සිදු වී ඇති බව ද විමර්ශනවලදී තහවුරු වී යැයි පොලිසිය සඳහන් කරයි.

සිද්ධිය සම්බන්ධයෙන් රත්නපුර මූලස්ථාන පොලිස් පරීක්ෂක ලයනල් මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.




# මුඛ ආවරණයෙන් අලි ජංජාලයක්

**(කරන්දෙණිය එම්. සුසිල් ප්‍රියන්ත)**




යතුරුපැදියෙන් යමින් සිටියදී ගැලවී යාමට වෙර දැරූ මුඛ ආවරණය සැකසීමට සිය බිරියගෙන් ඉල්ලූ සහයෝගය නිසා තුවාල පමණක් සිදු වී ජීවිතය අනූනවයෙන් බේරාගත් යුවළක් පිළිබඳ පුවතක් දකුණු පළාතෙන් අසන්නට ලැබේ.

මේ යුවළ සිය අවශ්‍යතාවකට යතුරුපැදියෙන් ගමන් ගනිමින් සිටියහ. යතුරුපැදිකරු පැළඳ සිටියේ දින කිහිපයක්ම පාවිච්චි කළ මුඛ ආවරණයකි. ඒ නිසාම එහි පටි ඇදී බුරුල් වී තිබිණ.

ඒ නිසාම යතුරුපැදියෙන් ගමන් ගනිද්දී වදින සුළඟත් සමඟම ඔහුගේ මුඛ ආවරණය ගැලවී යාමට වෙර දැරුවේ වරක් දෙවරක් නොවේ. එය යතුරුපැදියේ ගමන් ගනිද්දීම සැකසීමට උත්සාහ ගත්තත් එය සාර්ථක නොවීය. මුඛ ආවරණය නිරන්තරයෙන්ම ගැලවී යාමට වෙර දැරුවේ එය ඔහුට මහා වදයක් වෙමිනි.

ඒ නිසාම ඔහු මුඛ ආවරණය ගැලවී යාමට නොහැකි වන සේ සකසා ගැනීමට සිතුවේ, යතුරුපැදිය ධාවනය කරමින් සිටියදීය. ඒ සඳහා බිරියගේ සහාය ගැනීමට ඔහු සිතුවේය. ඒ, මුඛ ආවරණය දෙකනේ පටලවා ගැනීමටය. ඒ සඳහා ඔහු සිය හිස් ආවරණය බුරුල් කර සිය බිරියට මඳකට එය අතට ගන්නට යයි කියූවේ එහෙයිනි.

සැමියාගේ නියමය පරිදි හිස් ආවරණය අතට ගත් සැණින් ඇයගේ ජංගම දුරකතනයට ඇමතුමක් ආවේය. එය සම්බන්ධ වූ සැණින් සැමියා මුඛ ආවරණය දෙකනේ පටලවාගෙන හිස් ආවරණය හිසේ දමන ලෙස බිරියට කීවේය.

ඒ අනුව බිරිය හිස් ආවරණය ඔහුගේ හිසේ දැමුවාය. ඒ සමඟම යතුරුපැදිය පෙරළී ගියේ මහ හඬක් නංවමිනි. ආ ඇමතුමට අවධානය යොමු කළ බිරිය, ඔහුට හිස් ආවරණය පලඳවා ඇත්තේ ඉස්සර පස්ස මාරු කරය. ඒ සන්තෑසියෙන් දෙදෙනාට තුවාල පමණක් සිදු වී බේරී ඇත්තේ, ඒ අවස්ථාවේ වෙනත් වාහනයක් පාරේ නොගිය නිසාලු.

*ජනරජ ලකුණ උර මත ඇත්තේ තව ඒවා එක්ක ලු. කාකි ඇඳුමක් ලු. සුද්දාගේ කෙළිබිම පොතේ නීති රීතිත් වෙනස් කරන්න දස්සයෙක් ලු. එහෙම කරන්නේ හලෝවෙන් ලු.*

*වැස්ස වලාහක ආවත් ඒ නොතකා සටන් කරන්න කියනවා ලු. පොතපත දන්නා ඇත්තෝ අසරණ වෙනවා ලු.*

*බටහිර ක්‍රීඩාව දියුණු වෙයි ද මල් කුමාරයා දිනාවි ද කියන්න දන්නේ නැති ලු.*

*(පුෂ්පකුමාර මල්ලවආරච්චි)*







Available at:

JKOA | softlogic | softlogic MAX | SINGER | SINGHAGIRI | DAMRO | Dialog The Future.Today. | SLTMOBITEL The Connection | Samsung e-Store | mysoftlogic.lk | Kapruka.com Sri Lanka's Largest Online Shop | Keells | And all authorized dealers island wide

Contact us 011 Samsung 7267864

Image simulated. Galaxy M52, M32 are 5G ready. Compatibility dependent upon 5G network availability. Price starting at Rs. 74,999/-.
*Features vary by devices. Prices may subject to change without prior notice. For more details, visit www.samsungsrilanka.lk/

# මහජන මුදල් ගසාකන චෞරයන්ට අත දෙන රටක්

මහජන මුදල් 'සඟසතු දේපළකැයි' ඇදහූ පුණ්‍යවන්ත ඉතිහාසයක් මෙරට සතුය. මෙහි 'පුණ්‍යවන්ත' යැයි සඳහන් කරනු ලැබුවේ මහජන මුදල් නාස්ති කිරීම, මහජන මුදල් සොරකම් කිරීම අවීචි මහා නරකාදියෙහි ඉපදීමට හේතු වන මහා පාපයක් වන හෙයිනි. සඟසතු දේපළ භුක්ති විඳීම පෙරේතයන්, පිසාචයන් වී ඉපදීමට තරම් බලවත් පාපයක් බව පැරැන්නෝ සිතූහ. එලෙසින්ම මහජනයාගේ තඹ දෙයිතුවක හෝ තරම් මුදලක් ඔවුහු සොරකම් නොකළහ. නාස්ති නොකළහ.

දේශපාලනය බඩ රස්සාවක් බවට පත්ව ඇති කලෙක සියල්ල කණපිට හැරී ඇත. ඒ අනුව මහජනයාගේ මුදල් යනු හැකි නම් ගසා කෑමට ඇති දෙයකැයි ඔවුහු සිතති. මහජනයාගේ මහ ධනය තැන්පත් කර ඇති මහ බැංකුව මහ දවාලේ කොල්ලකන්න උත්සාහ කරන්නෙත්, පාරට දමන තාර ටිකෙන්, පාලමට ගෙනා යකඩ කැබැල්ලෙන්, සිමෙන්ති කොට්ටයෙන් ආදී වශයෙන් ඕනෑම දෙයක් සොරකම් කිරීමට, ඕනෑම දෙයකින් ගසාකෑමට ඔවුහු පෙළඹී සිටිති. මේ 'ඔවුහු' යන්නට බඩජාරි දේශපාලනඥයෝ ද චෞර කප්පිත්තෝ බවට පත්ව සිටින නිලධාරීහු ද අයත් වෙති.

ඉහත කාරණාව සනාථ කිරීමට සමත් ප්‍රවෘත්තියක් අප පුවත්පත ඉකුත්ද වාර්තා කළේය. එම ප්‍රවෘත්තියෙන් කියැවුණේ, මධ්‍යම වෙළෙඳපොළ ඉදිකිරීම සඳහා මහ නගර සභාවේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ මුදල ඉක්මවා සියයට 41ක් එනම්, රුපියල් කෝටි 28කට වැඩි මුදලක් ඉදිරිපත් කළ ලන්සුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බවය. අප ප්‍රවෘත්තියට අනුව මෙම කරුණු අනාවරණය වී තිබෙන්නේ, රජයේ ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේදීය. එනම්, කෝපා කමිටුවේදීය.

කෝපා, කෝප් වැනි කමිටු නොතිබෙන්නේ නම්, රටේ ධනයට සිදුවන්නේ කුමක්දැයි ජනතාවට දැන ගැනීමට තැනක් නැත. එහෙයින් මෙම කමිටු තිබීම අතිශයින්ම වැදගත්ය. මෙම කමිටුවල අභ්‍යන්තර සාකච්ඡා, පරීක්ෂණ එකල මාධ්‍යයට විවෘත වූයේත් නැත. යහපාලන ආණ්ඩුව සමයේදී මේවා මාධ්‍යයට විවෘත විය. එය යහපාලන යන අදහසට සාධාරණය ඉටු කිරීමකි. මෙමගින් රටේ ධනයට සිදුවන්නේ කුමක්දැයි ජනතාවට දැන ගැනීමේ හැකියාව ලැබී ඇත. එය අතුරු කතාවකි.

කුරුණෑගල මධ්‍යම වෙළෙඳපොළ ඉදිකිරීම සඳහා මහ නගර සභාවේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ මුදල ඉක්මවා සියයට 41ක් එනම්, රුපියල් කෝටි 28කට වැඩි මුදලක් ඉදිරිපත් කළ ලන්සුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබේ. සාමාන්‍යයෙන් මෙහිදී සිදුවන්නේ අඩුම ලන්සුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමය. රුපියල් කෝටි 28ක් ඒ මහත්වරුන්ට එතරම් මුදලක් නොවිය හැකිය. එහෙත් මේවා මහජනයාගේ මුදල්ය. එම මුදල් වියදම් කළ යුත්තේ වගකීමෙන්ය. එමෙන්ම පාරදෘශ්‍යභාවයෙන්ය.

මෙම කොන්ත්‍රාත් ප්‍රදානයේ සැකකටයුතු ප්‍රධාන කාරණාවක් තිබේ. එනම්, කෝපා කමිටුවේදී අනාවරණය වී තිබෙන්නේ, පළමුව සකස් කළ ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරැදිව සකස් වී නොමැති බවය. එය එසේ වූයේ කෙසේ ද? ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කිරීමේදී මධ්‍යම වෙළෙඳපොළේ එක් වැදගත් ස්ථානයක් හලා ඇස්තමේන්තුව සකස් කළ විට අතරමගදී එම ස්ථානය ඇස්තමේන්තුගත වී නොමැති බව අනාවරණය වෙයි. එම වරද තිබියදී ගොඩනැගිල්ල සම්පූර්ණ කළ නොහැකිය. එවිට සිදුවන්නේ කටට එන ගණනක් කඩදාසිවල ලියා එම මුදල අතට ගැනීමය.

සොරකම් අතර සාමූහික සොරකම් ද වේ. කුරුණෑගල මධ්‍යම වෙළෙඳපොළ ඉදිකිරීමේදී සිදු වී තිබෙන්නේ එබඳු සාමූහික සොරකමක් ද යන ප්‍රශ්නය මතු වේ. පළමුව සකස් කළ ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරැදිව සකස් වී නොමැති බව අනාවරණය වීමෙන් පසුව ඇස්තමේන්තුව සකස් කළ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස කෝපා කමිටුව නිර්දේශ කළ බව ද අප ප්‍රවෘත්තියෙහි සඳහන්ය.

නිලධාරීන්ගේ වග වීමේ තරම ඉහත සිදුවීමෙන් මනාව පැහැදිලිය. රාජ්‍ය නිලධාරීන්ට මෙලෙස වගකීම් විරහිත ලෙස කටයුතු කළ හැකි ද? මහජනයාගේ බදු මුදලින් ඉගෙනගත් මෙම නිලධාරීන් පෙරළා එම ජනතාවට යුතුකම් ඉටු කළ යුතුය. ඒ සඳහා පඬුරු පාක්කුඩම් ඇවැසි නැත. ඒ වෙනුවට කළ යුත්තේ, මහජනයාගේ එක රුපියලක් හෝ සොරකම් නොකිරීමට, අපතේ නොයැවීමට කටයුතු කිරීමය.

කුරුණෑගල මධ්‍යම බස් නැවැතුමෙහි මගී ජනතාවට පහසුවෙන් රැඳී සිටීමට වෙන් කර ඇති හිස් භූමියේ ව්‍යාපාරිකයන් 31 දෙනකුට කඩ කාමර 31ක් පෞද්ගලික වියදමින් ඉදිකර ගැනීමට අවසර දී ඇති බව කෝපා කමිටුවේදී අනාවරණය වී තිබේ. එමෙන්ම, කුරුණෑගල මධ්‍යම වෙළෙඳපොළේ අදියර 1 සහ 2 යටතේ ඉදිකරමින් පවතින කඩ කාමර 123ක් හා මාලිගාපිටියේ කඩ කාමර 12ක් දිගු කාලීන බදු ක්‍රමය යටතේ නිවැරැදි ක්‍රමවේදයකින් තොරව ලබා දීම සම්බන්ධ තොරතුරු ද මෙහිදී අනාවරණය වී තිබේ.

මේවා 'අම්මාගේ අප්පාගේ බූදල' නොවේ. මේවා රාජ්‍ය දේපළ වේ. මහජනතාවගේ මුදල් වේ. තම ගජ මිතුරන් සමග සිත්සේ භුක්ති විඳීමට තමන්ට හැකියාවක් ඇතැයි යමකු සිතන්නේ නම්, හෙතෙම දේශපාලනයට සුදුසුම නැත.

ලංකාදීප

2021 නොවැම්බර් මස 17 වැනිදා බදාදා

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත

වෙබ් අඩවි--: වෙබ්.ලංකාදීප.ලංකා- www.lankadeepa.lk


කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237 ෆැක්ස් : 2438039, 2479240, 5383240 බෙදාහැරීම් : 2479625 ෆැක්ස් : 2479650

දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2479595

**කාලීන සටහන**

# ආයෝජන ආපසු හරවන දේශප්‍රේමය

**ශ්‍රී ලාංකීය, චින්තනයට පැරණි වාමවාදීන්ගේ සහ ව්‍යාජ දේශප්‍රේමීත්වයේ අදහස් දැඩිව බලපා තිබේ. විශේෂයෙන් ව්‍යාජ ආර්ථික දේශප්‍රේමී ප්‍රලාප ඊට මුල්වී ඇත.**



**හර්ෂ ගුණසේන** විසිනි

**ඉ**කුත්ද යුගදනවි බලාගාරය සම්බන්ධයෙන් ආණ්ඩුව සහ ඇමෙරිකානු නිව්ෆෝට්‍රස් එනර්ජි සමාගම එළැඹුණු ගිවිසුමට එරෙහිව රජයට හවුල් වූ පක්ෂ එකොළහක්, ලංවිම වෘත්තීය සමිති සහ තවත් වෘත්තීය සමිති එක්ව විරෝධතාවක් දියත් කරනු ලැබුවේය. නිව් ෆෝට්‍රස් එනර්ජි යනු 2014 දී ආරම්භ කරනු ලැබූ ස්වභාවික ද්‍රව වායු (LNG) සැකසුම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන සමාගමකි.

රජයට සහයෝගය දුන් පක්ෂ එකොළහ, රජයට එරෙහි මෙම විරෝධතා පැවැත්වූයේ මහජන මන්ත්‍රණ සභාව (මමස) යන බැනරය යටතේය. මහජන මන්ත්‍රණ සභාව ප්‍රසිද්ධියට පත් වූයේ, මහින්ද රාජපක්ෂගේ පාලනය පැවති සමයේ සැබෑ ජන සහභාගීත්වයක් තිබුණ කාලයේය.

මෙගා වොට් 300ක ධාරිතාවකින් යුතු යුගදනවි බලාගාරය ඉදිකරනු ලැබුවේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් විසිනි. ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම ලංවිම සහ ස්කෝට්ලන්ත බෝනාර් ලෝන්ග් සමඟ ඒකාබද්ධව එම කර්තව්‍ය ඉටු කළේය. භාණ්ඩාගාරයට අයත් වෙස්ට් කෝස්ට් පවර් ලිමිටඩ් සමාගමට එහි සියයට 51ක අයිතිය හිමිය. සේවක අර්ථසාධක අරමුදලට සියයට 27ක හිමිකමකුත් LECO සමාගමට සියයට 18ක අයිතියකුත්, ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගමට එහි සියයට 4ක හිමිකමකුත් පවතී. යුගදනවි බලාගාරය 2010 දී ඉදිකිරීම් කටයුතු නිමා කරන විට එය ස්වභාවික ද්‍රව වායුවලින් ධාවනය කරන අභිප්‍රායෙන් ඉදි කරනු ලැබූ අතර, ස්වභාවික ද්‍රව වායුවලින් ධාවනය කරනතුරු ඒ අතර කාලය තුළ පමණක් ඩීසල්වලින් ධාවනය කිරීමට බලාපොරොත්තු වූයේය.

ඩීසල්වලට වඩා ස්වභාවික ද්‍රව වායුවලින් ධාවනය කිරීමේ වාසි බොහෝය. ස්වාභාවික ද්‍රව වායු (LNG) දහන කාර්යක්ෂමතාවෙන් ඉතා වැඩිය. ෆොසිල ඉන්ධන අතුරින් ඉහළම බලශක්තිය අන්තර්ගතව ඇත්තේ ස්වභාවික ද්‍රව වායුවලය. ඒවා දහනය වීමේදී පිරිසුදු බව වැඩි වනුයේ කාබන්ඩයොක්සයිඩ් සහ අනෙකුත් හරිතාගාර වායු නිකුත් වීම අවම නිසාය.

අනෙකුත් ඉන්ධනවලට වැය කරන මිලම වියදම්කොට ස්වභාවික ද්‍රව වායුවලින් වැඩි බලශක්තියක් උත්පාදනය කරගත හැකි වීම නිසා ආර්ථික අතින් ලාබදායී වේ. ඒවා ප්‍රවාහනය කළ යුත්තේ සෙ. අංශක -160ක උෂ්ණත්වයේ රඳවාගෙනයි. මේවා ප්‍රවාහනය උදෙසා ඊටම විශේෂිත ගබඩා පහසුකම් ඇති නෞකා තිබිය යුතුය.

## නිව් ෆෝට්‍රස් එනර්ජි (NFE) සමග ගිවිසුම

රජය නිව් ෆෝට්‍රස් සමාගම සමඟ ගිවිසුමට එළැඹියේ ජූලි මාසයේය. එය මධ්‍යම රාත්‍රියේ අත්සන් කරනු ලැබුවේ නිසි පරිදි කැබිනට් ඇමැතිවරුන්ගේ අනුමැතිය නොලබාය. එම ගිවිසුමට අනුව නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගම විසින් මුහුදේ පාවෙන ස්වභාවික ද්‍රව වායු ගබඩාවක් ඉදිකිරීමත්, එතැන් සිට යුගදනවි බලාගාරය දක්වා ස්වභාවික ද්‍රව වායු පරිවහනය කරන නළ මාර්ගයක් ඉදිකිරීමත් කළයුතුය. ඊට ප්‍රතිචාර ලෙස රජය අනිවාර්යයෙන් වසරකට ස්වභාවික ද්‍රව වායු BTU ඒකක (British Thermal Units) ට්‍රිලියන 35ක් මිලදී ගත යුතුය. එම ප්‍රමාණය යම් හෙයකින් මිලදී නොගත්තේ වුවද ඊට අදළ මිල රජය විසින් ගෙවිය යුතුය.

**ගිවිසුම වාසියට හැරවීම**

යුගදනවි බලාගාරයේ ධාරිතාව BTU (ඒකක) ට්‍රිලියන 15ක් පමණකි. එම නිසා භාවිත නොකරන අමතර BTU ට්‍රිලියන 20කට රජය මුදල් ගෙවිය යුතුය. වසරකට සාමාන්‍යයෙන් පරිහරණයට නොගන්නා එකී වායු ප්‍රමාණය සඳහා වැයවෙන සාමාන්‍ය වියදම ඩොලර් මිලියන 215ක් පමණ වේ. දැනට ඉදිවෙමින් පවතින කෙරවලපිටියේ නව බලාගාරයේ ඉදිකිරීම් සම්පූර්ණ වුවද රජයට භාවිත නොකරන BTU ප්‍රමාණයක් වෙනුවෙන් ඩොලර් මිලියන 90ක් පමණ නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගමට ගෙවීමට සිදුවේ.

මෙම මිලදී ගත යුතු අවම ස්වභාවික ද්‍රව වායු BTU ප්‍රමාණය ස්ථාවර ලෙස මිලදී ගත යුතු වනුයේ එසේ නොකළහොත් නිව් ෆෝට්‍රස් එනර්ජි සමාගමට පාවෙන ගබඩාව පවත්වාගෙන යාම හා නළ පද්ධතිය ඉදිකිරීම ආර්ථික වශයෙන් ලාභදායී නොවීම නිසාය. එම නිසා මෙරටට සිදුවන පාඩුව අවම කරගනු වස් රජය තවත් අමතර නළ මාර්ගයක් කැලණි තිස්ස දක්වා ඉදි කළ යුතුය. ඊට අමතරව තද වැසි පවතින කාලවලදී ජල විදුලි බලාගාර උපරිම ධාරිතාවෙන් යුතුව ධාවනය වෙන නිසා ස්වභාවික ද්‍රව වායු බලාගාරවලින් ලබාගන්නා ප්‍රමාණය ද අඩු කර ගත යුතු වන්නේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය නවතාලිය නොහැකි නිසාය.

එසේම යුගදනවි බලාගාරයේ වෙස්ට් කෝස්ට් පවර් ලිමිටඩ් හට අයත් සියයට 40ක කොටස් නිව් ෆෝට්‍රස් එනර්ජි වෙත ඩො. මිලියන 250කට විකිණීමටද රජය එකඟ වූයේය. මෙම ගිවිසුම අත්සන් කරන විටත් ලංවිම, පාවෙන ද්‍රව වායු ගබඩාවක් සහ නළ මාර්ගයක් ඉදිකිරීම උදෙසා ටෙන්ඩර් කැඳවා තිබිණි.

ඊනියා දේශප්‍රේමීන් සහ ලංවිම වෘත්තීය සමිති පළමු කොටම විරුද්ධ වන්නේ මෙම සියයට 40 විකිණීමටය. ටෙන්ඩර් පරිපාටිය යටතේ කොම්පැනියක් තෝරා ගත්තේ වුවද, ස්වභාවික ද්‍රව වායු සැපයීමේ ඒකාධිකාරිය එම කොම්පැනියට පැවරීමට සිදුවේ. පාවෙන බලාගාර කිහිපයක් තබා ගැනීමේ හැකියාව මෙරටට නොතිබීම ඊට හේතුවයි. මෙම සමාගම චීන සමාගමක් වූයේ නම් ඇතැම් විට මෙම දේශප්‍රේමීන් ඊට එකඟවන්නට ඉඩ තිබිණි. ඔවුන්ගේ ගැටලුව වන්නේ ඇමරිකානු සමාගමක් ස්වාභාවික ද්‍රව වායු සැපයීමේ ඒකාධිකාරිය හිමි කර ගැනීමයි.

කෙසේ වුවද එතැන ඇති සැබෑ ගැටලුව සියයට 40ක කොටස් හෝ ස්වාභාවික ද්‍රව වායු ඒකාධිකාරිය නම් ෆෝට්‍රස් එනර්ජි සමාගමට හිමිකර දීම නොව, රටට අවශ්‍ය නොවන ස්වභාවික ද්‍රව වායු (LNG) ප්‍රමාණයක් බලෙන් ඇගේ ගැසීම සඳහා වූ අවාසිදායක කොන්දේසියකට යටත් වීමයි. අතිරික්ත ස්වභාවික ද්‍රව වායු ප්‍රමාණය පරිහරණයට ගත හැකි වන අයුරින් කැලණි තිස්ස බලාගාරය වෙත සැපයීම් කටයුතු වර්ධනය කර ගත හොත් එවිට එම ගිවිසුම වාසිදායක බවට පත්කර ගත හැකිය.

ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකිරීමත්, කැබිනට් මණ්ඩලය වෙත දැනුම් නොදීමත් එහිදී සිදුවූ ප්‍රධාන දෝෂ වේ. මීට පෙර වරාය නගරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, චයිනා කොමියුනිකේෂන්ස් කන්ස්ට්‍රක්ෂන් කොම්පැනි ලිමිටඩ් ඉදිරිපත් කළ ලන්සුවකට 2013දී කැමැත්තෙන්ම ප්‍රදානය කිරීමේ පදනම මත දෙන්නට සිදුවිය. ඉන් අනතුරුව එවකට පැවති රජය, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිනොපැද අනෙකුත් උනන්දුව දක්වන පාර්ශ්වවලින් ව්‍යාපෘතිය සඳහා ලන්සු කැඳවූයේ මුල් යෝජකයාට කටයුතු ආරම්භ කිරීමේ අයිතිය පවරන අතරතුරේය.

මෙම ගැටලුවට ඒ කාලයේදී ප්‍රමාණවත් විරෝධයක් එම ගිවිසුමට එරෙහි වූවන් වෙතින් එල්ල නොවූයේ එවකට මූලික විරෝධය පරිසර ගැටලු මූලික කරගෙන පැන නැගුණු නිසාය. කෙසේ වුවද එක් අවස්ථාවක වැරදි පරිපාටිය අනුගමනය කිරීම තවත් අවස්ථාවක එසේ කිරීම මගින් යුක්ති සහගත වන්නේ නැත.

## වැරැදි දේශප්‍රේමය

විශේෂයෙන් මෙවැනි අදියරක පවත්වාගෙන යන ආර්ථිකයකදී මේ ආකාරයේ අමන දේශප්‍රේමයකට වැඩි ප්‍රමුඛතාවක් දීම අනතුරුදයකය. කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තයේ කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් රජය, ඉන්දීය හා ජපාන සමාගම් දෙකකට ඉන් පෙර පැවති රජයේ ගිවිසුමකට අනුව පවරා දීමට උත්සාහ කරන අවස්ථාවේ, කොළඹ අන්තර්ජාතික බහාලුම් පර්යන්තයේ (CICT) සියයට 85ක් පසුගිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් චීන කොම්පැනියකට පවරා දෙද්දී කරබාගෙන සිටි වෘත්තීය සමිති, බරපතළ විරෝධයක් පෑවෝය.

එහි ප්‍රතිඵලයක් ලෙස රජය බටහිර බහාලුම් පර්යන්තයේ සියයට 85ක් (50% ද ඉක්මවා යමින්) ඉන්දීය සමාගමකට පැවරුවේය. ඊට වෘත්තීය සමිති කර බාගෙන එකඟ විය. දැන් නැගෙනහිර බහාලුම් පර්යන්තය ඉදිකරන්නට අරමුදල් නොමැතිව ආණ්ඩුවට ළත වෙන්නට සිදුවී තිබේ. මෙවරද රජය ගිවිසුම හකුළා නොගතහොත් තමන් තදබල වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා බවට ලංවිම වෘත්තීය සමිති තර්ජනය කරති.

**පොරොන්දු කඩමින් යථාර්ථයට**

රජය රසායනික පොහොර තහනම් කරමින් අතිශය වැරදි සහගත තීරණයකට එළඹුණු විට මෙම සහායක පක්ෂ 11 බකන්නිලාගෙන සිටියෝය. ජනාධිපතිවරයා තම තීරණය එක්සත් ජාතීන් ඉදිරියේත් අනතුරුව එ.ජා.ගේ දේශගුණ විපර්යාස සමුළුව ඉදිරියේත් කියා පෑවේය. එම මූලික තීරණයෙන් පසුව තවත් දැඩි තීරණ කිහිපයක්ම ගනු ලැබුවේය. දැන් රජය ප්‍රමිතියකින් තොර කාබනික පොහොර සපයන ප්‍රශ්නගත චීන සමාගම සමඟ අවුලක පැටලී ලිහාගන්නට කතනමින් සිටී. චීන තානාපති කාර්යාලය අපගේ නීති පද්ධතියටත්, බැංකු ක්‍රමයටත් එරෙහිව යටිකුට්ටු ක්‍රියා කරන්නට යත්න දරමින් සිටී. එය අපගේ ස්වෛරීතාවයට මැදිහත් වන්නට උත්සාහ දැරීමක් වන අතර ඒ සම්බන්ධයෙන් හවුල් පක්ෂ එකොළහට කිසිදු ආරෝවක් නැත.

1957 බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම අත්සන් කළ අවස්ථාවේ ජේ.ආර්. ජයවර්ධන අනුගමනය කළ ක්‍රියාමාර්ගයට ප්‍රධාන විපක්ෂය අවතීර්ණය විය යුතු නොවේ. බණ්ඩාරනායක බලයට පත්වූයේ සිංහල බෞද්ධ මතධාරීන්ගේ කර මතිනි. ඔහු එම කාර්යය කළේ බලයට පත්වීම සඳහා පමණකි.

සිංහල පමණක් පනතේ නරක අතුරු විපාක තේරුම් ගැනීමෙන් පසුව එය සමනය කර ගැනීම සඳහා ඔහු බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම අත්සන් කළේය. ජේ.ආර්. ඊට විරුද්ධ වූයේ තමා බලයට පත් වීමේදී අනුගමනය කළ මූලධර්මය මත පිහිටා බණ්ඩාරනායක ඒවා අනුගමනය කළ යුතුය යන තර්කයේ පිහිටාය. එහි ප්‍රතිඵලයක් ලෙස මහනුවර පාගමනත්, බෞද්ධ භික්ෂූන්ගේ වෙනත් විරෝධයනුත් සිදුවූ නිසා බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ඉරා දැමිණි. එම ගිවිසුම ක්‍රියාත්මක වූයේ නම් 30 අවුරුද්දක් පුරා පැවති දීර්ඝ යුද්ධයට අපි මුහුණ නොදෙන්නෙමු.

## පෞද්ගලිකකරණය


මෙම වර්තමාන ආණ්ඩුව බලයට පත් වූයේ කිසිදු රාජ්‍ය දේපළක් පෞද්ගලිකකරණය නොකරන බවට මහජනතාවට බොරු පොරොන්දු දෙමින්ය. දැන් මහපොළව මත සිදුවන යථාර්ථයට මුහුණ දෙන්නට සිදු වී ඔවුහු තම පොරොන්දුවලට එරෙහිව කටයුතු කරති. කෙසේ වුවද ස.ජ.බ. සහ එ.ජා.ප, රජයේ දේපළ පෞද්ගලීකරණය කිරීමේ තම මූලධර්මවල පිහිටා සිටිය යුතුය. රජයකට තම පොරොන්දු ඉටු කිරීමට බලකිරීමට වඩා දිගු කාලීන ආර්ථික වාසි රටට ලැබීම වැදගත්ය.

චන්ද්‍රිකා කුමාරතුංග සමයේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව පෞද්ගලිකකරණය කිරීමේ යහපත් ඵල ප්‍රයෝජන අපි දැන් ලබමින් සිටිමු. එය කදිම නිදර්ශනයකි. එම නිසා 1957 දී ජේ.ආර්. අනුගමනය කළ ක්‍රියාමාර්ගය ප්‍රධාන විපක්ෂ අනුගමනය නොකළ යුතු වේ.

ශ්‍රී ලාංකීය, චින්තනයට පැරණි වාමවාදීන්ගේ සහ ව්‍යාජ දේශප්‍රේමීත්වයේ අදහස් දැඩිව බලපා තිබේ. විශේෂයෙන් ව්‍යාජ ආර්ථික දේශප්‍රේමී ප්‍රලාප ඊට මුල්වී ඇත. වෘත්තීය සමිති තම රැකියා සුරක්ෂිතභාවය සලකා ව්‍යාජ ආර්ථික දේශප්‍රේමීත්වයට මුවා වෙමින් කටයුතු කරති. එයින් සිදු වන්නේ දැවැන්ත රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතාව වර්ධනය වී මහජන දේපළ අකර්මන්‍ය බවට පත්වීමයි. එය ශ්‍රී ලංකාව වැනි රටක ආර්ථිකය වනසා දමන්නට අනිවාර්යයෙන්ම හේතු වනු නියතය.

2021 නොවැ. 08 ද Daily FT පුවත්පතේ පළවූ Yugadanavi Power Plant and Economic Patriotism - ලිපියේ පරිවර්තනය

**සමන් පුෂ්ප ලියනගේ**



## පෝය ලබන ගෙවෙන වේලාවන්

| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
|---|---|---|---|
| නොවැ:18 | පසළොස්වක | ප.ව.12.00 | 19 දා පෙ.ව.14.27 |
| නොවැ:27 | අව අටවක | පෙ.ව.5.43 | 28 දා පෙ.ව.06.00 |
| දෙසැ:03 | අමාවක | ප.ව.16.55 | 04 දා ප.ව.13.12 |
| දෙසැ:10 | පුර අටවක | ප.ව.19.09 | 11 දා ප.ව.19.13 |

## අභිලාශය ප්‍රකාශ කිරීම (EOI)

Sri Lanka Cricket

**ශ්‍රී ලංකාවට එරෙහිව එංගලන්ත 19 න් පහළ එක්දින තරඟාවලිය සඳහා රූපවාහිනී නිෂ්පාදන සේවා සපයන්නන් වෙතින් අභිලාශය කැඳවීමට අපේක්ෂා කරනු ලබයි.**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම සහ එංගලන්ත 19 න් පහළ කණ්ඩායම අතර තරග 05 කින් සමන්විත එක්දින තරගාවලිය ආවරණය වන පරිදි රූපවාහිනී නිෂ්පාදන සේවා සැපයීම සඳහා සුදුසු රූපවාහිනී නිෂ්පාදන සමාගම් වෙතින් අභිලාශය කැඳවීමට අපේක්ෂා කෙරේ

ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම සහ එංගලන්තය 19 න් පහළ කණ්ඩායම අතර තරග 05 කින් සමන්විත එක්දින තරඟාවලිය 2021 නොවැම්බර් 30, දෙසැම්බර් 03, 08, 05 සහ 10 යන දිනයන් හීදී කොළඹ සිංහල ක්‍රීඩා සමාජ ක්‍රීඩාංගණයේදී (SSC) පැවැත්වේ.

මෙම තරඟාවලිය පෙරවරු 09.45 ට ආරම්භ වන අතර පස්වරු 05.30 ට අවසන් වීමට නියමිතය.

ඉහත තරඟාවලිය සජීව විකාශය සහ නිෂ්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශව පිළිගත් විකාශන ප්‍රමිතීන්ට අනුව අවම වශයෙන් අධි තාක්ෂණික වීඩියෝ කැමරා 10 කින් සමන්විතව රූපවාහිනී නිෂ්පාදන කටයුතු සිදු කළ යුතු වන අතර රූපවාහිනී විනිසුරු පහසුකම ද ලබා දීමේ හැකියාවෙන් සමන්විය යුතුවේ.

මේ සඳහා උනන්දුවක් දක්වන පාර්ශව සිය ආයතනය/ සංවිධානය පිළිබඳ ආයතනික තොරතුරු සාරාංශයක් සහ ආයතනය පිළිබදව කෙටි හැඳින්වීමක් සමඟ (Profile) එක් එක් තරඟාවලි සඳහා වන පිරිවැය, (නිෂ්පාදන සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ විචාරක ගාස්තු ඇතුලත්ව) අදාල අභිලාශ ප්‍රකාශනය 2021 නොවැම්බර් මස 27 වන දින දහවල් 12ට හෝ ඊට පෙර **sponsorship@srilankacricket.lk** යන ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය.

මෙම අභිලාශ ප්‍රකාශනය කිසිදු පෙර දැනුම් දීමකින් තොරව ස්ව අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක අවලංගු කිරීම, සංශෝධනය කිරීම, හෝ වෙනස්කම් වලට ලක් කිරීමේ මේ හිමිකම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතුවේ

**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ක්‍රිකට්**

## අභිලාශය ප්‍රකාශ කිරීම (EOI)

Sri Lanka Cricket

**ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම සහ එංගලන්තය 19 න් පහළ කණ්ඩායම අතර පැවැත්වෙන එක්දින තරඟාවලිය සඳහා රූපවාහිනී නිෂ්පාදනය, විකාශනය සහ ක්‍රීඩාංගණ හිමිකම් (TV PRODUCTION, THE BROADCASTING AND GROUND RIGHTS) ලබා ගැනීම සඳහා අභිලාශය ප්‍රකාශ කිරීම**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම සහ එංගලන්තය 19 න් පහළ කණ්ඩායම අතර තරග 05 කින් සමන්විත එක්දින තරඟාවලිය සඳහා විකාශන අයිතිය (තරගවල රූපවාහිනී නිෂ්පාදනය ඇතුළුව) සහ ක්‍රීඩාංගණ හිමිකම් (GROUND RIGHTS) සඳහා සුදුසු රූපවාහිනී විකාශන ආයතන වෙතින් අභිලාශය කැඳවීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම සහ එංගලන්තය 19 න් පහළ කණ්ඩායම අතර එක්දින තරඟාවලිය 2021 නොවැම්බර් 30 වන දා, සිට දෙසැම්බර් 10 වන දා දක්වා කොළඹ සිංහල ක්‍රීඩා සමාජ ක්‍රීඩාංගණයේදී (SSC) පැවැත්වේ.

මෙම තරඟාවලිය පෙරවරු 09.45 ට ආරම්භ වන අතර පස්වරු 05.30 ට අවසන් වීමට නියමිතය.

ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම බංග්ලාදේශ 19 න් පහළ කණ්ඩායම සමග ඔක්තෝබර් මාසයේ පැවැත්වූ එක්දින තරඟාවලිය ජයග්‍රහණය කරන ලදී. එමෙන්ම 2022 මුල් භාගයේ බටහිර ඉන්දීය කොදෙව්හි පැවැත්වීමට නියමිත 19 න් පහළ ලෝක කුසලානයට පෙර සංචාරක එංගලන්ත 19 න් පහළ කණ්ඩායමට එරෙහිව ශ්‍රී ලංකා 19 න් පහළ කණ්ඩායම හොඳින් තරඟ කරනු ඇතැයි අපේක්ෂා කරන අතර මෙම තරඟාවලිය දැඩි මහජන උනන්දුවක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඒ අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉහත සඳහන් තරඟාවලිය ආවරණය වන පරිදි, පහත සඳහන් එක් එක් අංශවලින් විකාශන සහ අනෙකුත් අයිතිවාසිකම් හා/හෝ දේශීය රූපවාහිනී විකාශන ක්ෂේත්‍රයන්හී උනන්දුවක් දක්වන සමාගම් වෙතින් උනන්දුව ප්‍රකාශ කිරීම සහ, ඒ සඳහා වටිනාකම් ඉදිරිපත් කිරීමට මෙයින් ආරාධනා කර සිටී.

විකල්ප 01

■ **රූපවාහිනී නිෂ්පාදනය, විකාශනය සහ ක්‍රීඩාංගණ හිමිකම්**

උනන්දුවක් දක්වන සමාගම්, ඉහත සඳහන් එක්දින තරඟාවලියට අදාළව රූපවාහිනී නිෂ්පාදනය, රූපවාහිනී විකාශන හා ක්‍රීඩාංගණ අයිතීන් ලබා ගැනීමට ඉදිරිපත් විය යුතු අතර ඒ සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හිමිකම් ගාස්තුවක් (Rights Fee) ගෙවිය යුතුය. (රූපවාහිනී නිෂ්පාදනය, රූපවාහිනී විකාශන සහ ක්‍රීඩාංගණ හිමිකම් සම්බන්ධයෙන් දැරීමට සිදුවන පිරිවැය අදාල සමාගම විසින් දැරිය යුතු අතර එය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ගෙවිය යුතු හිමිකම් ගාස්තුවට අමතරව ගෙවිය යුතු වේ.)

විකල්ප 02

■ **රූපවාහිනී විකාශනය සහ ක්‍රීඩාංගණ හිමිකම්**

ඉහත සඳහන් එක්දින තරගාවලියට අදාළව රූපවාහිනී විකාශන හා ක්‍රීඩාංගණ හිමිකම් ලබා ගැනීමට උනන්දුවක් දක්වන සමාගම් විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හිමිකම් ගාස්තුවක් ගෙවියයුතුවේ. (රූපවාහිනී විකාශන සහ ක්‍රීඩාංගණ හිමිකම් සම්බන්ධයෙන් දැරීමට සිදුවන පිරිවැය අදාල සමාගම විසින් දැරිය යුතු අතර එය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ගෙවිය යුතු හිමිකම් ගාස්තුවට අමතරව ගෙවිය යුතු වේ.)

ඉහත සඳහන් විකල්ප එකක් හෝ කීපයක් සඳහා උනන්දුවක් දක්වන පාර්ශව සිය ආයතනය/ සංවිධානය පිළිබඳ ආයතනික තොරතුරු සාරාංශයක් සහ ආයතනය පිළිබදව කෙටි හැඳින්වීමක් සමඟ (Profile) සිය අභිලාශ ප්‍රකාශනය 2021 නොවැම්බර් මස 27 වන දින දහවල් 12ට හෝ ඊට පෙර **sponsorship@srilankacricket.lk** යන ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය.

මෙම අභිලාශ ප්‍රකාශනය කිසිදු පෙර දැනුම් දීමකින් තොරව ස්ව අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක අවලංගු කිරීම, සංශෝධනය කිරීම, හෝ වෙනස්කම් වලට ලක් කිරීමේ මේ හිමිකම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතුවේ

**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ක්‍රිකට්**

# ශ්‍රී ලංකාවට විශිෂ්ට ජයක්



ශ්‍රී ලංකා කණ්ඩායමේ වීරයා අහමඩ් වසීම් රසීක් (වමේ) ඊයේ තරගයේදී...
(ඡායාරූපය- ගයාන් අමරසේකර)

(නාමල් පතිරගේ)

**බංග්ලාදේශය ගෝල 2-1 කට ඊයේ (16) රාත්‍රියේ පරාජයට පත් කළ ශ්‍රී ලංකාව 'මහින්ද රාජපක්ෂ' කුසලාන සිවුකොන් පාපන්දු තරගාවලියේ අනිද්දා (19) පැවැත්වෙන අවසන් මහ තරගය සඳහා සුදුසුකම් තහවුරු කර ගත්තේය. එය ශ්‍රී ලංකාව වසර 2006 න් පසු අන්තර් ජාතික පාපන්දු තරගාවලියක අවසන් මහ තරගයට නිර්දේශ ලබා ගත් පළමු අවස්ථාවයි.**

ඒ අනුව ශ්‍රී ලංකාව හා ෂිසෙල්ස් රාජ්‍යය අතර අවසන් මහ තරගය අනිද්දා රාත්‍රී 8ට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ රිඩ් මාවත ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්වේ.

ඊයේ තරගයේදීත් ශ්‍රී ලංකාවේ ගැලවුම්කරුවා වූ අහමඩ් වසීම් රසීක් ගෝල දෙකම වාර්තා කරමින් දෙවැනි වතාවටත් තරගයේ වීරයාට සම්මාන ලැබීය. 25 වැනි විනාඩියේදී පළමු ගෝලයද හා 90+1 වැනි විනාඩියේදී දඬුවම් පහරක් නිවැරදි එල්ලයටම යොමු කරමින් දෙවැනි ගෝලයද වාර්තා කළ අහමඩ් වසීම් රසීක් තරගාවලියේ වාර්තා කළ හයවැනි ගෝලය මෙයයි.

මෙම වසරේදී ඔහු ලබාගත් ජාත්‍යන්තර තරග හත්වැනි ගෝලය ලෙසත් එය වාර්තා පොතට එක්වේ. ඔහුගේ මෙම විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍ය හමුවේ මේ වන විට ඔහුට පාපන්දු ක්‍රීඩාවේ දියුණුතම මැද පෙරදිග රටකින් ක්‍රීඩා කිරීමට ආරාධනා ලැබී ඇති බවද වාර්තා වේ.

කෙසේ වුවත් බංග්ලාදේශය ඊයේ තරගයේදී වඩාත්ම අවාසනාවන්ත තත්ත්වයකට පත්වූයේ මෙම තරගය ජය පරාජයෙන් තොරව අවසන් කිරීම තුළින් වුවද ඔවුන්ට අවසන් මහ තරගයට ප්‍රවේශ වීමේ අවස්ථාව හිමිව තිබූ බැවිනි.

71 වැනි විනාඩියේදී පිරිනැමුණු දඬුවම් පහරක් ශ්‍රී ලංකා දැල් රකින්නා වන නායක සුජාන් පෙරේරා අභිබවමින් ලබා ගත්තේ අතිරේක ක්‍රීඩකයකු ලෙසින් පසුව පිටියට පිවිසි ජුවෙල් රානා විසිනි.

ඔක්තෝබර් 01 වැනිදා මාලේ නුවරදී ශ්‍රී ලංකාව 13 වැනි සාෆ් ශූරතා තරගාලියේදී ගෝල 1-0 කට බංග්ලාදේශයට පරාජය වීමෙන් පසුව දෙරට ජාත්‍යන්තර පාපන්දු තරගයකදී ළඟ ළඟම මුණගැසුණු දෙවැනි අවස්ථාවක් මෙයයි.

ශ්‍රී ලංකාව වසර 2018 න් පසු අන්තර් ජාතික පාපන්දු තරගයක් ජයගත් පළමු අවස්ථාව මෙය වන අතර එහිදීත් ශ්‍රී ලංකාවට පරාජය වූයේ බංග්ලාදේශය වීම කැපී පෙනේ.

ඊයේ පස්වරුවේ පැවැති ෂිසෙල්ස් - මාලදිවයින තරගය නිලකුණු තත්ත්වයක් මැද අවසන්වීමෙන් ෂිසෙල්ස් අවසන් මහ තරගයට අනෙක් පසින් වැඩීම ප්‍රසාද ලකුණු මත නිර්දේශ විය.

# තුන්වැනි දිනයත් වැස්සට සේදෙයි

**ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන බටහිර ඉන්දීය කොදෙව් පිල සහ ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිගේ පිල අතර පැවැත්වෙන සිවුදින තරගයේ තෙවැනි දිනයත් වර්ෂාව හේතුවෙන් සම්පූර්ණයෙන් අතහැර දැමීමට විනිසුරුවෝ තීරණය කළහ. එස්.එස්.සී ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන මෙම තරගයේ පළමු සහ දෙවැනි දිනයන් දෙකත්, තෙවැනි දිනය වූ ඊයේ (16 වැනිදා) දිනයත් වර්ෂාවට සේදී ගියේය.**

සිවුදින තරගයේ දින තුනක්ම මේ වනවිට වර්ෂාව හේතුවෙන් සේදී ගොස් ඇති අතර අද (17 වැනිදා) දිනයේදී වර්ෂාව පතිත නොවූවද සති ගණනක් පුරා ඇද හැලෙන වර්ෂාව නිසා ක්‍රීඩාංගණයේ සමහර ස්ථාන ජලය බැස නොයන තත්වයට පත්ව ඇත. එබැවින් ටෙස්ට් තරගාවලියට සහභාගිවන ක්‍රීඩකයන්ගේ ආරක්‍ෂාව ගැන සලකා බලා සිවුවැනි දිනයත් අතහැර දැමීමට බොහෝ ඉඩකඩ ඇත.

ඒ අනුව මාස ගණනක් පුරා සුදු පන්දුවට ඇස හුරුකරගෙන සිටි කණ්ඩායම් දෙකෙහි ක්‍රීඩකයන් වැඩි පිරිසකට රතු පන්දුවට ඇස හුරුකර ගැනීමට තිබූ අවස්ථාව ගිලිහී යමින් පවතී. **- 2079**

# කබඩි සම්මේලනය තරගාවලිය වර්ජනය කරයි

(නාමල් පතිරගේ)

**ජාතික තරුණ සේවා සභාව සංවිධානය කරන 33 වැනි ජාතික යොවුන් ක්‍රීඩා උළෙලේ කබඩි තරගමාලාව වර්ජනය කරමින් ඊට විනිසුරුවන් හා තීරකවරුන් සහභාගි කිරීම අත්හිටුවන බව ශ්‍රී ලංකා කබඩි සම්මේලනයේ සභාපති අනුර පතිරණ මහතා පවසයි.**


මෙම කබඩි තරගමාලාව ලබන සිකුරාදා හා සෙනසුරාදා (19-20) කාන්තා හා පිරිමි කණ්ඩායම් 52 ක සහභාගිත්වයෙන් යාපනය ස්කාන්ත්වෝදය විදුහල් පිටියේදී පැවැත්වීමට නියමිතය.

ගාල්ල දිස්ත්‍රික්කයේ අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යොවුන් ක්‍රීඩා කබඩි තරගාවලියේදී විනය ක්‍රියාමාර්ග හමුවේ තහනමට ලක් කළ විනිසුරුවන් දෙදෙනකු මෙම තරගාවලියට සහභාගි කරගැනීමට විරෝධය පළ කරමින් කබඩි සම්මේලනය මෙම තීරණයට පැමිණ ඇත.

මෙම විනිසුරුවන් දෙදෙනා විනිශ්චයට හවුල් කරගත් එකී ප්‍රාදේශීය කබඩි තරගාවලිය නැවත නිවැරදි පිළිවෙළකට පැවැත්වීම හැරෙන්නට මේ සම්බන්ධයෙන් කබඩි සම්මේලනයට එකඟ විය හැකි වෙනත් විකල්පයක් නැතැයි ද අනුර පතිරණ මහතා වැඩිදුරටත් පැවැසීය.

මේ අතර, තරුණ සේවා සභාවේ සභාපති දමිත වික්‍රමසිංහ මහතාගෙන් කළ විමසුමකදී පැවැසුවේ, කුමන තත්ත්වයක් මැද වුව ද මෙම තරගාවලිය යොදගත් දින දෙකේදීම පවත්වා අවසන් කිරීමට කටයුතු කරන බවයි. ඒ සඳහා කබඩි සම්මේලනය සමග මේ වන විට පවත්වන සාකච්ඡා ධනාත්මක මට්ටමක පවතින බවත් ඔහු එහිදී වැඩිදුරටත් පැවැසීය.

## ඔබගේ ඇහීම අඩුද?



ජාත්‍යන්තර ශ්‍රවණ විශේෂඥයෙකු නොමිලේ online හමු වී ඔබේ ගැටලු විසඳා ගන්න

Dr. මෙරියල් සී, MCIAud AuD ස්විට්සර්ලන්තයේ පිහිටි Philips ශ්‍රවණ උපකරණ සඳහා ජාත්‍යන්තර නිෂ්පාදන පුහුණුකාරිනියක හා ලොව පුරා Demant සහෝදර සමාගම්වල මෘදුකාංග, සම්බන්ධතා සහ තාක්ෂණික උපදෙශිකාවක ලෙස කටයුතු කරයි.

**විශේෂ ශ්‍රවණ සායනය**
**නොවැම්බර් 26 - මහරගම**
**දෙසැම්බර් 03 - වැල්ලවත්ත**

**Online** සායනයේ හමුවීම් **සීමාසහිත බැවින්** ඔබගේ වේලාව අදම වෙන් කරගන්න. මෙයට සමගාමීව, අප ආයතනයේ **ජ්‍යෙෂ්ඨ ශ්‍රවණවේදිනියක** විසින් මෙහෙයවන **විශේෂ ශ්‍රවණ සායනයට ද** ඔබට සම්බන්ධ විය හැක.

**ශ්‍රවණාධාර සඳහා 20% දක්වා වට්ටම්**

**අමතන්න 0117 575 101**

VISION CARE HEARING SOLUTIONS

**විෂන් කෙයා ඔප්ටිකල් සර්විසස් පුද්ගලික සමාගම**
**අංක 374, හයිලෙවල් පාර, නාවින්න, මහරගම**

PHILIPS HearLink

**කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 17 වැනිදා බදාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.**
Lankadeepa - Printed and published by Wijeya Newspapers Ltd. on Wednesday 17th November, 2021 at No. 8, Hunupitiya Cross Road, Colombo 02, Sri Lanka.
Telephone: Editorial Dept: 2448321, 2423919, 5330813 Fax: 2438039, Advertising Dept: 2479540, 5383383, 5330330, Fax: 2314864, 2304144 Circulation Dept: 2435454, 2448322, 2479625 Fax: 2459725 General: 2314714